# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2111/4 - 2019 පෙබරවාරි මස 18 වැනි සඳුදා - 2019.02.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණ සේවා ව්‍යවස්ථාව - සංශෝධන අංක 04

2016 අගෝස්තු මස 23 වැනි දින අංක 1981/43, 2014 දෙසැම්බර් මස 12 වැනි දින අංක 1892/40 හා 2014 දෙසැම්බර් මස 19 වැනි දින අංක 1893/39 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍ර* මගින් සංශෝධිත 2013 ජුනි මස 26 වැනි දින අංක 1816/12 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව නියෝගකර තිබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

එම්. ඒ. බී. දයා සෙනරත්,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2018 ජුනි මස 05 වැනි දින.

(i) 15.4 යන ඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කරනු ලැබේ :

15.4 - මෙම ව්‍යවස්ථාව අනුමත වී වසර 07 ක කාලයක් දක්වා ව්‍යවස්ථාවේ නවවන ඡේදය යටතේ දැක්වෙන උත්තල මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු හා මුද්‍රණ නිමැවුම්කරු, පෙර මුද්‍රණ සැලසුම්කරුවන්, මුද්‍රණ සංස්කාරකවරුන් හා කොම්පියුටර් ටයිප් සෙටර් හා මුද්‍රණ රටා සිත්තම්කරුවන් යන තනතුරු සඳහා තෝරාගනු ලබන අභ්‍යන්තර අයදුම්කරුවන් අතුරෙන් මුද්‍රණ නිමැවුම්කරු තනතුර සඳහා තෝරා ගැනීමෙන් පසු රජයේ මුද්‍රණ ආයතනය විසින් පවත්වන්නා වූ පොත් බැඳුම්කරණය පිළිබඳ මාස 06කට නොඅඩු පාඨමාලාවකින් සමත්වීම හා උත්තල මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරුවන්, පෙර මුද්‍රණ සැලසුම්කරුවන්, මුද්‍රණ සංස්කාරකවරුන් හා කොම්පියුටර් ටයිප් සෙටර් හා මුද්‍රණ රටා සිත්තම්කරුවන් වශයෙන් තෝරා ගැනීමෙන් වසරකට පසුව ඒ සඳහා දෙපාර්තමේන්තුව පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයකින් සමත්වීම ඔවුන් ස්ථිර තනතුරුවලට පත් කිරීම සඳහා ප්‍රමාණවත් වේ. තව ද, එම ඡේදය යටතේ ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු තනතුර සඳහා තෝරා ගනු ලබන අභ්‍යන්තර අයදුම්කරුවන් එසේ තෝරා ගැනීමෙන් පසු රජයේ මුද්‍රණ ආයතනය විසින් පවත්වනු ලබන ලිතෝකරණය මාස 06කට නොඅඩු පාඨමාලාවකින් සමත් වීම ඔවුන් ස්ථිර තනතුරුවලට පත් කිරීම සඳහා ප්‍රමාණවත් වේ. මෙම ව්‍යවස්ථාව අනුමත වී වසර 07කට පසුව ඉහතින් දැක්වෙන තනතුරු සඳහා බඳවා ගැනීමේදී NVQ 5 මට්ටම පැවතියහොත් මෙම ව්‍යවස්ථාවේ 10.3 ඡේදය යටතේ දැක්වෙන විධිවිධාන අදාල විය යුතු ය.

1A - G 29481 — 12 (2019/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ii) පළමුවන පරිශිෂ්ඨයේ අනු අංක 6 යටතේ පහත සඳහන් පරිදි නව උප වගන්තියක් ඇතුළත් කරනු ලැබේ ඃ

6. (අ) තනතුර අයත් ක්ෂේත්‍රයට අදාල ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 3 වන මට්ටමේ වෘත්තීය සුදුසුකමක් සම්පූර්ණකර ඇති අයදුම්කරුවන් මෙම සේවා ව්‍යවස්ථාවේ සඳහන් අ. පො. ස. (සා/පෙළ) සුදුසුකම් සම්පූර්ණකර ඇති අයදුම්කරුවන් ලෙස සලකනු ලැබේ.

(ආ) තනතුර අයත් ක්ෂේත්‍රයට අදාල ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 4 වන මට්ටමේ වෘත්තීය සුදුසුකමක් සම්පූර්ණකර ඇති අයදුම්කරුවන් මෙම සේවා ව්‍යවස්ථාවේ සඳහන් අ. පො. ස. (උ/පෙළ) සුදුසුකම් සම්පූර්ණකර ඇති අයදුම්කරුවන් ලෙස සලකනු ලැබේ.

***සටහන.***-ඉහත සඳහන් විධිවිධානයන් තනතුරට බඳවා ගැනීමේ සුදුසුකමක් ලෙස ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටමක් ඇතුළත්කර ඇති තනතුරු සඳහා පමණක් අදාල වේ.

03 - 222

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.